# කතෝලික ආගම මඟින් සිංහල බෞද්ධ සංස්කෘතියට සිදුවන බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

ආර්.එම්.ජී.පී. රත්නායක - ඉතිහාසය අධ්‍යයනාංශය

කතෝලික ආගම ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය, ඉගැන්වීම් සහ ප්‍රාතිහාර්ය පදනම් කොටගත් ඒක දේවවාදී ආගම්වලින් එකකි. ක්‍රි. ව. 16 වන සියවසට පූර්වයෙන් ලංකාවේ කතෝලික භක්තිකයන් සිටි බවට අනුරාධපුර කෞතුකාගාරයේ තැන්පත් කර ඇති ගලක කොටන ලද නෙස්ටෝරින් කුරුසයට අමතරව කොස්මස් සහ ඉද්‍රිසි යන විදේශිකයන්ගේ වාර්තා අනුව ක්‍රිස්තියානි ආගම වෙළෙඳුන් මාර්ගයෙන් පැමිණි බව නිරීක්ෂණය වේ. එමඟින් සැලකිය යුතු සංස්කෘතික බලපෑමක් නොවූ අතර අනතුරුව පැමිණි පෘතුගීසි, ලන්දේසි සහ බ්‍රිතාන්‍යය යටත් විජිත සමයේ ප්‍රබලවම සිදුවූ මිෂනාරී ක්‍රියා මඟින් කතෝලික ආගම ව්‍යාප්ත විය. මෙම පර්යේෂණයේ මූඛ්‍ය අරමුණ කතෝලික ආගම මඟින් සිංහල බෞද්ධ සංස්කෘතියට පැහැදිලි බලපෑමක් සිදුවූ බව පෙන්වා දීමයි. පර්යේෂණ ගැටලුව වශයෙන් කතෝලික ආගම මඟින් සිංහල බෞද්ධ සංස්කෘතියට බලපෑමක් සිදුව තිබේද? යන්න විමර්ශනය කිරීම අපේක්ෂාවයි. දත්ත රැස්කිරීමේ විධික්‍රම වශයෙන් ප්‍රාථමික සහ ද්විතීයික දත්ත යොදා ගැනීමේ දී ප්‍රාථමික දත්ත රැස් කිරීම සම්මුඛ සාකච්ඡා මඟින්ද, ද්විතීයික දත්ත රැස් කිරීම පොත්පත්, සඟරා සහ අන්තර්ජාලය ආදිය භාවිත කරමින් සිදු කෙරුණි. මෙම පර්යේෂණයෙන් අනාවරණය වූ පරිදි, පෘතුගීසි, ලන්දේසි සහ බ්‍රිතාන්‍යය යුගවල දී මිෂනාරීවරුන්ගේ සැලකිය යුතු බලපෑම හේතුවෙන් කතෝලික ආගම මඟින් සිංහල බෞද්ධ සංස්කෘතියට ප්‍රබල බලපෑමක් වූ බව විද්‍යමාන වෙයි. එමඟින් නිගමනය කළ හැකි වන්නේ අද්‍යතන අධ්‍යාපන ක්‍රමය සහ නූතන ගෘහ නිර්මාණ ශිල්පය, අනාථ නිවාස ක්‍රමය, පහතරට විහාරවල යථාර්ථවාදී බිතුසිතුවම් කලාව, සිංහල ගීතිකා, කතෝලික සිංහල සාහිත්‍ය, වෙසක් භක්ති ගීත, (මළපොත) වෙස්සන්තර ජාතක කවි ගායනය, නව වචන සහ වාසගම් ඇතිවීම, සුසාන භූමිවල පිළිම නිර්මාණය, විධිමත් විවාහ ක්‍රමය, බෞතිස්මකරණය, නාට්‍ය කලාව සහ සිංහල ගද්‍යයේ විකාශනය කතෝලික ආගම මඟින් සිදුවූ බවයි.

*ප්‍රමුඛ පදඃ කතෝලික ආගම, සංස්කෘතිය, සාහිත්‍යය, මිෂනාරී අධ්‍යාපන ක්‍රමය*